**වැලිගම ප්‍රාදේශීය සභාව - 2022**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

වැලිගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට දැන්වීම් පුවරු 10 ක් වෙනුවෙන් අය විය යුතු රු.403,600 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු ටැෆේ ට්‍රැක්ටර් ට්‍රේලරයෙහි රු.330,000 ක්වූ වටිනාකම මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඊට පෙර වර්ෂයන් වෙනුවෙන් ලැබිය යුතු කර්මාන්ත ණයගැතියන් රු. 967,925 ක් ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.113,699 ක් සඳහා විවිධ ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් රු. 10,785,409 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 02 කට අදාළව ගැලපීම් කිරීමේදී රු. 49,425,340 ක බැර ශේෂයක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,093,543 කින් වරෙන්තු ගාස්තු හා දඩ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය අනුව ආදායම් ශීර්ෂ 4 කට ලැබුණු රු. 303,524ක ආදායම අදාළ ගිණුම්වලට බැර කර නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී ආදායම් ශීර්ෂ 3 කට අදාළව ආදායම රු.2,151,366 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් ගොඩනැඟිලි සංවර්ධනය සඳහා දරන ලද රු. 3,106,381 ක් වූ වියදම ඉඩම් ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම රු.790,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේදී වියදම් ශීර්ෂ 04 කට අදාළව වියදම රු.6,880,139 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.136,433,538 ක් වූ ගිණුම් විෂයයන් 05කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.9,144,101ක අසමානතා පැවතුණි. | එකඟ වන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.75,950,516ක් වූ ගිණුම් විෂයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟ වන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104 (4) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු කැබ් රථයට හා ටිපර් රථයට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබූ අතර ටිපර් රථයේ අනතුරෙන් පසු අලුත්වැඩියාවට රු.355,924 ක් වැය කර තිබුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2019 ජුනි 17 දිනැති හා අංක 09/2009 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (I) වගන්තිය | වැලිගම ප්‍රාදේශීය සභාවේ ආදේශක සේවකයින් 04 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකර, ලිඛිත රාජකාරි පැවරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.962,899 ක දෛනික වැටුප් ගෙවා තිබුණි. | එකඟ වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2022 අප්‍රේල් 26 දිනැති හා අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvi) වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය | වැලිගම ප්‍රාදේශීය සභාව විසින් ආගමික උත්සවයක් වෙනුවෙන් සභා අරමුදලින් රු.378,330 ක වියදමක් දරා තිබූ අතර ඒ සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | එකඟ වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා රීති) හා 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී වැලිගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරකම් ප්‍රචාරය කිරීමට බව අඟවමින් රු.1,150,000 ක් එක්තරා රූපවාහිණී ආයතනයක් වෙත ගෙවා තිබූ අතර අයවැය චක්‍රලේඛයේ විධිවිධානයන්ට බැහැරව මෙම වියදම් දරා තිබුණි. | කොම්පෝස්ට් පොහොර අලෙවි ප්‍රවර්ධනය සඳහා දරන ලද වියදමක් බව. | රීති හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 සහ 132 වගන්ති | සභා බල ප්‍රදේශයේ පිහිටි ඇළ මාර්ග 08 ක් හාරා මඩ ඉවත් කිරීම සඳහා සභාව සතු ස්කැවේටර් යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් පැය 147 ක් සඳහා ඉන්ධන ලීටර් 882 ක් වෙනුවෙන් සහ ඇළමාර්ග 19 ක් සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවන් 04 දෙනෙකු වෙනුවෙන් ගොවි සංවිධානයකට රු.5,871,477 ක මුදලක් ගෙවා තිබූ නමුත් ප්‍රාදේශීය සභා විෂය පථයට අයත් නොවන එම කාර්යයන් සඳහා අනුමැතියකින් තොරව සභා අරමුදලින් වියදම් දැරීම සිදු කර තිබුණි. | සියළු ආයතන වල එකඟතාවය මත ක්‍රියාත්මක කර ඇති බව. | කොන්ත්‍රාත් විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.89,001,946 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.95,226,175 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 31,735,300 | 22,693,922 | 16,944,134 | 30,999,727 | 27,035,300 | 27,232,944 | 18,059,413 | 25,249,939 |
| කුලී | 6,370,000 | 2,896,359 | 3,483,791 | 1,709,922 | 4,240,000 | 2,280,037 | 1,830,580 | 2,297,354 |
| බලපත්‍ර ගාස්තු | 11,960,100 | 2,570,341 | 1,891,059 | 876,191 | 12,960,100 | 4,039,889 | 4,233,216 | 196,909 |
| වෙනත් ආදායම් | 30,918,100 | 135,864,078 | 136,205,521 | 4,152,703 | 19,388,100 | 16,861,928 | 14,583,602 | 4,494,146 |
| **එකතුව** | 80,983,500 | 164,024,700 | 58,524,505 | 37,738,543 | 63,623,500 | 50,414,798 | 38,706,811 | 32,238,348 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු.25,103,295 ක් වූ අතර, වරිපනම් ඒකක 22708 කට අදාලව වර්ෂය තුලදී බිල් කිරීම් රු.22,499,643 ක් සමඟ රු.47,602,938 ක් අය විය යුතුව තිබුණි.වර්ෂය තුලදී මුළු අයවීම් රු.10,665,396 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 17124 කට අදාළව රු.30,863,928 ක හිඟ ශේෂයක් පැවතුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කාමර 62 ක් පැවති අතර ඉන් කඩ කාමර 35 කින් රු.1,324,563 ක හිඟ කඩ කාමර කුලී අය විය යුතුව පැවතුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | සභාවට අයත් වෙළෙඳ සංකීර්ණ 02 ක පිහිටි කඩ කාමර 03 ක් ගිවිසුම්ගතවීමකින් තොරව බදුදී තිබුණි. | එකඟ වන බව. | බදු ගිවිසුම්වලට එළඹිය යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු කඩ කාමර 19 කට අදාළව කඩබදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණු අතර වැලිගම ප්‍රාදේශීය සභාවේ වෙළෙඳ සංකීර්ණ 03කට අයත් කඩ කාමර 05 කින් අයවිය යුතු එක්වන් මුදල් රු.455,133 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | එකඟ වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | බලපත්‍ර ගාස්තු ආරම්භක හිඟය රු.196,909 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 2,570,341 ක් සමඟ රු.2,767,250 ක් අයවීමට තිබුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වෙනත් ආදායම් ශේෂය රු.4,494,146 ක් වූ අතර වර්ෂය තුළදී බිල් කිරීම් රු.135,864,078 ක් සමඟ රු.140,358,224 ක් අය විය යුතුව පැවතුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.136,205,521 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.4,152,703 ක හිඟ ශේෂයක් පැවතුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු. 4,390,418 ක් හා මුද්දර ගාස්තු රු.206,577,545 ක් අයවිය යුතුව තිබුණි. | **එකඟ වන බව.** | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඌ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්, ආපනශාලා සහ නවාතැන්පොලවල ලැබීම්වලින් 1% ක ගාස්තු අය කිරීම කළ යුතු වුවත් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හෝටල් 75 කින් එසේ ගාස්තු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (එ) | වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 61 කින් රු. 611,861 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

**2.3 අධිභාර**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයේදී රු. 6,109,042 ක් වූ අධිභාර 05 ක් පනවා තිබුණි. | සහකාර පළාත් පාලන කොමසාරිස්ට වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වැලිගම ප්‍රාදේශිය සභාව සතු කොම්පෝස්ට් අංගනයේ ඉදිකරන ලද ගවගාලට සමාලෝචිත වර්ෂයේදි වරින් වර ලැබී තිබුණු ගවයින් 12 දෙනෙකු පිළිබඳ තොරතුරු 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 194 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 අගෝස්තු 17 දිනැති හා අංක PR/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැය වූ රු.11,686,000 ක වියදම ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | එකඟ වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23 (5) හා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 4(i) හා 13(2) නියෝග රෙගුලාසිවලින් බැහැරව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බණ්ඩාරමුල්ල ප්‍රදේශයේ ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන මාර්ගයේ වම් පසින් රූඩ් 03 යි පර්චස් 24 ඉඩම කැබලි කර විකිණීම සම්බන්ධයෙන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් නොවූ ඉදිකිරීම් 12 ක් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.5,252,038 ක ගාස්තු අයකර එම ඉදිකිරීම් විධිමත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | අංක BA/2014/199 දරන ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රය මගින් අනුමැතිය ලබා දුන් සැලැස්මෙන් බැහැරව සිව් වන මහලක් ඉදිකර තිබූ අතර ඊට අමතර ගොඩනැගිලි දෙකක් ඉදිකර තිබුණි. මෙම ඉදි කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර රු.516,060 ක ගාස්තු අයකර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | එම | එම |

**3.4 මත භේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභා පරිශ්‍රයේ ඉන්ධන බවුසර් ටැංකියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 3,742,404 ක වියදමක් දරා තිබූ අතර බවුසර් ටැංකිය සහ එයට අදාළ අනෙකුත් උපකරණ මිලදී ගැනීම, ස්ථාපිත කිරීම හා ආරක්ෂක ආවරණ වහලක් සකස් කිරීම 1988 (මුල්‍ය හා පරිපාලන) රීති හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සිදු කර තිබුණි. එසේම සංචිත කර තිබූ ඩීසල් පුරවන ලද බවුසරයේ ටැංකියේ ස්ථාන 02 කින් තෙල් කාන්දු වෙමින් පැවතිණි. | එකඟ වන බව. | රීති හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෘෂි නවෝදය වැඩසටහන යටතේ බීජ හා පැළ මිලට ගැනීම සඳහා රු.2,195,520ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබූ අතර 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 211 , 207 හා මුදල් රෙගුලාසි 237 න් බැහැරව සිදු කර තිබූ අතර පැළ බෙදා දීමෙන් පසු, පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | එකඟ වන බව. | රීති හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | වැලිගම ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව විසින් අනුමත නොකරන ලද ගොඩනැඟිලි සැලසුම් 02 ක් සභාපති විසින් තම නිල මුද්‍රාව තබා අනුමත කර තිබූ අතර ක්ෂේත්‍ර පරීක්ෂණ දින වන විටත් වර්ග අඩි 1205.3 ක නේවාසික දෙමහල් ගොඩනැගිල්ලක් හා වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | එකඟ වන බව. | සැලසුම් කමිටු නිර්දේශ මත කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී කඹුරුගමුව කසළ ව්‍යාපෘතියට යාබදව පිහිටි පිඹුරු අංක 35/215 දරන ඉඩමෙන් පර්චස් 100 ක් මිලදී ගැනීමේදී එවකට සභාපති සතු ඉඩමක් රු. 1,000,000 කට තුන්වන පාර්ශවයකට විකුණා එම ඉඩම නැවත මාස 02 කින් රු. 9,400,000 කට සභාවට මිලදී ගෙන තිබුණි. | එකඟ වන බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ මාර්ගෝපදේශයන්ට පටහැනි ලෙස ප්‍රසම්පාදන සැලසුමේ ඇතුලත් කර නොතිබුණු රු.7,227,904 ක් වටිනා ප්‍රසම්පාදන 12 ක් සභාව විසින් සිදුකර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | එකඟ වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.8.5 (අ) ප්‍රකාරව වැලිගම ප්‍රාදේශීය සභාවේ රු. 5,075,834 ක් වටිනා මිලදී ගැනීම් 18 ක් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවකට යොමු කර මිලදී ගැනීම සිදු කර නොතිබුණි. | එකඟ වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | වැලිගම ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ කිලෝ වොට් 10 ක (10 kw) සූර්ය පැනල සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,752,500 ක වියදමක් සභා අරමුදලින් වැය කර තිබුණද, මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තාව සකස් කිරිමට හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව කටයුතු කර තිබුණි. | එකඟ වන බව. | රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 208 ප්‍රකාරව ගබඩා හා ද්‍රව්‍ය සැපයීම හැකිතාක් දුරට පොදු තරඟකාරීත්වයක් අනුව සිදු කිරීමට ක්‍රියා කළ යුතු වුවත් කොම්පෝස්ට් අංගනයේ විවිධ ඉදිකිරීම් සඳහා අවස්ථා 24 කදී මිලදී ගෙන තිබූ රු.1,566,477 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ සඳහා මිල ගණන් කැඳවා නොතිබුණි. | එකඟ වන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් කර්මාන්ත 10 ක් වෙනුවෙන් අවස්ථා 10 කදී අත්තිකාරම් ලෙස පෞද්ගලික පාර්ශවයකට රු.5,237,548 ක්ද අනුමත සමිති දෙකකට රු.793,000 ක්ද ගෙවා තිබූ අතර පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීමේදී ලබාගත් අත්තිකාරම් බැඳුම්කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වන බව. | කොන්ත්‍රාත් විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | කඹුරුගමුව කසළ අංගනයට පිවිසෙන හා ඇතුළත මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීමේදී ඉටු නොකරන ලද මීටර් 20.5 ක ප්‍රමාණයකට රු.274,243 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම වැඩසටහන මෙහෙයවන නිලධාරියාගේ ස්ථානමාරුව නිසා ප්‍රමාණ පෙන්වීමේ අඩුපාඩු සිදු වූ බවත්, ඔහුගේ ප්‍රකාශය අනුව එම ප්‍රමාණ නිවැරදි වූ බව. | ඉටු කළ වැඩ සඳහා ගෙවිය යුතු වේ. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ස්ථානමාරුවී ගිය, සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 1,282,344 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් සේවකයින් බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබියදී වැලිගම ප්‍රාදේශීය සභාව විසින් සේවක අතිරික්තතා පවතින හා අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති තනතුරු 05 ක් සඳහා අනියම් පදනම මත සේවකයින් 07 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | එකඟ වන බව. | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |